# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2055/14 – 2018 ජනවාරි මස 24 වැනි බදාදා – 2018.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/15/19/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.08.27 දිනැති හා අංක 1825/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.08.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කැළණිය, වරාගොඩ, ශ්‍රියාකාන්තා ගාඩින්ස්, නො. 280/8 ඒ හි පදිංචි ඊ.පී.ආර්.ඒ. එමිල් මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, කින්සි පාර, අංක 56/1 හි පිහිටි ඇෆ්නෝ (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.10.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,  
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 16 වැනි දින,  
කම්කරු දෙපාර්තමේන්තුව,  
කොළඹ 05.


1A – G 26980 – 14 (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: අයිආර්/15/19/2011.

කාර්මික අධිකරණයේ දීය.

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
ඊ.පී.ආර්.ඒ. එමිල් මහතා,
අංක 280/8 ඒ,
ශ්‍රීයාකාන්තා ගාඩ්න්ස්, වරාගොඩ,
කැළණිය.
*පළමු පාර්ශවය,*

නඩු අංකය : A/3519

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
ඇෆ්නෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
අංක 56/1, කින්සි පාර,
කොළඹ 07.
*දෙවන පාර්ශවය,*

අතර පවතින ආරවුල.

ප්‍රදානය

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) දරන පනත සමඟ කියැවෙන) පනත්වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2013.08.07 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

<u>ආරවුලට හේතු වී ඇති කාරණය</u>

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණා වනුයේ:

> *"01. ඇෆ්නෝ (ප්‍රයිවට්) ලිමිටඩ් හි ව්‍යාපාර සංවර්ධන කළමනාකරු ලෙස සේවය කළ ඊ.පී.ආර්.ඒ. එමිල් මහතාට 2009 ජුනි මස සිට 2010 මැයි මස දක්වා මෝටර් රථයේ ධාවන හා නඩත්තු වියදම් සහ ඉන්ධන දීමනාව ප්‍රතිපූරණය නොකිරීම යුක්තිසහගත ද යන්න හා නොඑසේ නම් ඔහුට කුමන සහනයක් හිමි විය යුතු ද යන්න පිළිබඳ ව,*
>
> *02. ඊ.පී.ආර්.ඒ. එමිල් මහතාට 2009 සහ 2010 වර්ෂවල නිවාඩු වැටුප් සඳහා හිමිකම් ලබන්නේ ද යන්න හා හිමිකම් ලබන්නේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් මොනවා ද?"*

යන්න පිළිබඳ ව වේ.

<u>පෙනී සිටීම</u>

මෙම නඩුවේ පළමුවැනි පාර්ශ්වය ලෙස තමාට අසාධාරණයක් සිදුවී යැයි පවසමින් සහනයක් පතන ඊ.පී.ආර්.ඒ. එමිල් මහතා නඩු කටයුත්තේ කිසි ම දිනෙක ඊට සහභාගි නොවී ය. පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් කිසිදු නියෝජිතයෙකු හෝ ඉල්ලුම්කරු වෙනුවෙන් බලය පවරන ලද නීතිඥවරයෙකු කිසි දිනෙක හෝ පෙනී සිටියේ නැත.

මෙම බේරුම්කරණ විභාගය විභාගයට ගන්නා ලද දින දෙකෙහි දී ම දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ඇෆ්නෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනයේ මානව සම්පත් කළමනාකාර නිරෝෂා ද සේරම් මහත්මිය පැමිණියා ය. තව ද දින දෙකෙහි දී ම එකී ආයතනය වෙනුවෙන් නීතිඥ ලසන්ත සල්ගාදු මහතා පෙනී සිටියේ ය.

<u>නඩු පටිපාටිය</u>

බේරුම්කරණ විභාග පටිපාටිය අනුව පළමුවන සහ දෙවන පාර්ශ්වයන්ට තම ස්ථාවරය දැක්වෙන පළමුවැනි ප්‍රකාශය 2013.09.05 වැනි දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙස කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී විසින් දැනුම් දී ඇත. ඒ සඳහා තවත් කාලය දෙන ලෙස දෙපාර්ශ්වයෙන් ම ඉල්ලීම් ලැබී ඇත. ඒ අනුව ඒ සඳහා ඉඩක් සළසා දෙනු ලැබුවත් අපේක්ෂිත පළමු ප්‍රකාශය ලබා දී ඇත්තේ දෙවන පාර්ශ්වය වන වගඋත්තරකාර ආයතනය විසින් පමණි.

ඒ අතරතුර 2013.09.07 දිනැති ෆැක්ස් පණිවුඩයක් මගින් ඉල්ලුම්කරු ලේඛකාධිකාරි වෙත දන්වා ඇත්තේ තමා රැකියාවක් සඳහා විදේශගත වූ බවත්,

2014 ජුනි මාසය වන තෙක් ආපසු දිවයිනට නොපැමිණෙන බවත් ය. අදාල ලියවිලි සමහරක පිටපත් තමා විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සබඳතා ඒකකයේත්, මැද කොළඹ ඒකකයේත් තබා ඇති බව ද එම ෆැක්ස් පණිවුඩයේ සඳහන් කර ඇත. තමාගේ ඉල්ලීමට අදාල අවශ්‍ය තොරතුරු තමා පෞද්ගලික ව හෝ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් බේරුම්කරණය ඉදිරියේ තැබීම ඉල්ලුම්කරුවෙකුගේ වගකීම වන අතර කවර ලියවිලි පාර්ශ්වයන්ට අදාල වේ දැයි සොයමින් යාමට කාර්මික අධිකරණයට හැකියාවක් නොමැත. එකී ෆැක්ස් පණිවුඩයේ පැවති අනෙක් ගැටලුව වූයේ එය එවනු ලැබුවේ කොහි සිට ද යන්න සොයා ගැනීමට, එය එවන ලද ලිපිනයක් නොවීම ය. ඒ නිසා එකී ෆැක්ස් පණිවුඩයට පිළිතුරක් යැවීමට කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරීට නොහැකි විය.

මෙම පසුතලය යටතේ තවදුරටත් කල් දීමෙන් පසු ව නඩුව 2013.11.20 දින පැවැත්වීමට පළමු වතාවට කැඳවනු ලැබුණි.

එදින බේරුම්කරණ විභාගයට පළමුවැනි පාර්ශවයේ ඉල්ලුම්කරු පෙනී සිටියේ නැත. එදින පරීක්ෂණයට තමා සහභාගි වන නොවන බව දන්වා කිසිදු ලිපියක් වත්, දුරකතන පණිවුඩයක් වත් එවා නැත. ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිතයෙකු හෝ නීතිඥ වරයෙකු වත් එදින පෙනී සිටියේ නැත. දෙවන පාර්ශවයේ ආයතනය වෙනුවෙන් ඇෆ්නෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ මානව සම්පත් කළමනාකාර නිරෝෂා ද සේරම් මහත්මිය පැමිණියා ය. තවද ආයතනය වෙනුවෙන් නීතිඥ ලසන්ත සල්ගාදු මහතා පෙනී සිටියේ ය.

එබැවින් පරීක්ෂණය 2013.12.13 දින පැවැත්වීමට දින නියම කොට කල් තබන ලදී.

දෙවැනි දිනය වූ 2013.12.13 දින දී ද පළමුවැනි පාර්ශවයේ ඉල්ලුම්කරු පෙනී සිටියේ නැත. එදින පරීක්ෂණයට සහභාගී වන නොවන බව දන්වා කිසිදු ලිපියක් වත්, දුරකතන පණිවුඩයක් වත් එවා නැත. ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිතයෙකු හෝ නීතිඥ වරයෙකු වත් එදින පෙනී සිටියේ නැත. දෙවන පාර්ශවයේ ආයතනය වෙනුවෙන් ඇෆ්නෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ මානව සම්පත් කළමනාකාර නිරෝෂා ද සේරම් මහත්මිය පැමිණියා ය. එදින ද ආයතනය වෙනුවෙන් නීතිඥ ලසන්ත සල්ගාදු මහතා පෙනී සිටියේ ය.

එදින බේරුම්කරණ විභාගයේ දී දෙවන පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා විරෝධතාවක් ඉදිරිපත් කරමින් කියා සිටියේ යම්කිසි උනන්දුවක් තිබුනා නම් ඉල්ලුම්කරුට පෞද්ගලික ව පෙනී සිටීමට හැකියාවක් නොමැති නම් නියෝජිතයෙකු මාර්ගයෙන් පෙනී සිටිමින් තම ස්ථාවරය දක්වන්නට ඉල්ලුම්කරුට හැකියාවක් තිබුණු බවයි. තවද අවිනිශ්චිත ව විභාගය දීර්ඝ වන බැවින් 2014 ජුනි මාසය වන තෙක් එය කල් තබනවාට ආයතනය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරමින් විරුද්ධ විය.

ඒ අනුව එදින මම මෙසේ තීරණයක් සටහන් කර තැබුවෙමි.

> *''........මේ හේතුව නිසා ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවට ආපසු පැමිණි දිනක ඔහුට අවශ්‍ය නම් නැවත ඉල්ලීමක් ඉදිරිපත් කර අලුත් නඩු නිමිත්තක් ආරම්භ කිරීමට ඇති අයිතියට ඉඩ තබමින් මෙම ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.''*

යනුවෙනි.

කෙසේ වෙතත් මා කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරි වෙත දැනුම් දෙනු ලැබුවේ ඉල්ලුම්කරුගෙන් යම් ඉල්ලීමක් ලැබුනහොත් මා වෙත දැනුම් දෙන ලෙසයි. මේ වන තෙක් වුව ද කිසිදු ඉල්ලීමක් ඉල්ලුම්කරුගෙන් නොලැබීමෙන් පෙනී යන්නේ ඒ පිළිබඳ ව ඔහුගේ උනන්දුවක් නොමැති බවයි. එබඳු ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන සාධාරණ කාලය ද දැන් වන විට ඉකුත් වී ගොස් ඇත. එම නිසා ඉහතින් දක්වා ඇති බේරුම්කරණය සඳහා වන යොමු කිරීම සම්බන්ධයෙන් තව දුරටත් කටයුතු කිරීම මෙයින් අවසන් කරමි.

**ප්‍රදානය**

කම්කරු සහ කම්කරු සමිති සබඳතා අමාත්‍යතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත් වලින් සංශෝධන වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2013.08.07 දිනැති නියෝගයෙන් මා වෙත යොමුකර ඇති යොමුව සම්බන්ධයෙන් වන කාර්මික ආරවුලට අදාල ඊ.පී.ආර්.ඊ.එමිල් මහතාගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරමි.

එස්. විරිතමුල්ල
බේරුම්කරු
2017 ඔක්තෝබර් මස 10 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

02 - 277

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.